**රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය - 2016**

**---------------------------------------------------------------------------**

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 ජූනි 07 දින එළඹි අංක 2624 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------------**

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම ක්‍රියාත්මක කිරීම කෙරෙහි වගකීම දරයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතියෙහි ණය ගැනුම්කරුගේ මූල්‍ය අවකාශය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,344.8 කට සමාන එජඩො මිලියන 40.8 ක් වන අතර ඉන් රු.මිලියන 4,034.8 කට සමාන එජඩො මිලියන 30.8 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය කාර්යයන් 2010 මැයි 01 දින ආරම්භ කරන ලද අතර 2013 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණ බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ල.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම** | **උපයෝජනය කළ අරමුදල්** | | |
|---|---|---|---|---|---|---|
| | | | | **සමාලෝචිත වර්ෂය තුළ** | **2016 දෙසැම්බර් 31 දිනට** | |
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ආ.සං.බැ. | 30.80 | 4,034.80 | 667.00 | 664.00 | 11.61 | 1552.00 |
| ශ්‍රීලංර | 10.00 | 1,310.00 | 96.00 | 95.00 | 2.06 | 275.00 |
| **එකතුව** | **40.80** | **5,344.80** | **763.00** | **759.00** | **13.67** | **1827.00** |

ඉහත තොරතුරු අනුව, රු. මිලියන 4034.80 කට සමාන එ.ජ.ඩො. මිලියන 30.80 ක් වූ මුළු වෙන් කිරීමෙන් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කර වර්ෂ 6 ½ ක් ගත වීමෙන් පසුවත්, ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණේ රු. මිලියන 1552.00 කට සමාන ඩොලර් 11.61 ක් හෙවත් සියයට 37.69 ක්

පමණකි. එබැවින් වෙන් කිරීම් වලින් එ.ජ.ඩො මිලියන 19.19 ක්වූ ඉතිරි ශේෂය ඉදිරි මාස 10 ක කාලපරිච්ඡේදය තුල ණය පහසුකම් වසා දැමීම දක්වා උපයෝජනය කිරීමේ හැකියාව බොහෝ දුරට සැක සහිතය.

## 3.2 භෞතික ප්‍රගතිය

ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ධාරිතා සංවර්ධනය නම් වූ ප්‍රධාන සංරචක දෙකකින් ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වේ. 2016 දෙසැම්බර් 31 දිනට එම සංරචකයන් යටතේ ඇති කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු පද්ධති යටිතල පහසුකම් සැපයීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ගනුදෙනුකාර භාවිතය හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 14 දින විදේශීය සමාගමකට රු. මිලියන 2356.75 කට සමාන එ.ජ.ඩො. මිලියන 17.76 කට පිරිනමා තිබුණු අතර 2015 අප්‍රේල් 23 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, දේශීය ජාලයන කිරීම (Local Area Network) සවි කිරීම, පවත්නා ගිණුම්කරණ පද්ධතිය ඉහල නැංවීම හා පද්ධති අවශ්‍යතා පිරිවිතරයක් වේගවත් කිරීම හා වෙනස් කිරීම ආදියේ ප්‍රමාදයන් හේතුවෙන් එහි භෞතික ප්‍රගතිය 2016 දෙසැම්බර් 31 දිනට මන්දගාමීව පැවතුණි. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවක් නිම කිරීමට හා අමාත්‍යාංශයට අනුබද්ධ විශේෂඥයන් පද්ධති පිරිවිතරයන්ගේ අවශ්‍යතාවයන් සමාලෝචනය කිරීම සඳහා ලබා ගන්නා ලද කාල ප්‍රමාදයන් ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථානගත කිරීම ප්‍රමාද වීමට බලපා ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා විසින් දැනුම් දී තිබුණි.

(ආ) ධාරිතා සංවර්ධන සංරචකය යටතේ පුහුණු කිරීමට නියමිත නිලධාරීන්ගේ වාර්ෂික ඉලක්ක ව්‍යාපෘතියේ ආරම්භක අවස්ථාවේදී තීරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ධාරිතා සංවර්ධන සංරචකය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 82 දෙදෙනෙකුට විදේශ පුහුණු හා මණ්ඩලික සාමාජිකයන් 200 කට පමණක් දේශීය පුහුණු වීම් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා අනෙකුත් දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ ලබා දී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ස්වාධීන තහවුරුවක් සඳහා වූ ක්‍රොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොවන ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනුවෙන් වූ මොරටුව විශ්වවිද්‍යාලය වෙත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 14.97 කට 2016 සැප්තැම්බර් මාසයේදී ප්‍රදානය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ පර්ච්ඡේද 3.4 අනුව විශේෂඥයින් තෝරාගැනීම් හා යෙදවීම යටතේ සටහන් කර තිබූ අවශ්‍යතාවයන්ට පටහැනිව ව්‍යාපෘතිය මෙම කාර්යය සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් හා අයවැයක් පිළියෙල කර නොතිබුණි.

(ආ) විශේෂ සේවා සැපයීම සඳහා සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීමට විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර නොතිබුණි. ඒ වෙනුවට පුහුණු කටයුතු සඳහා විශේෂඥයන් තේරීම එකඟතාවය මත පත් කරන ලද වෙනම කමිටුවක් මඟින් සිදුකොට තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම්වලට අනුව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාල කමිටුව පත්කරනු ලැබ ඇති අතර එහි අරමුණ ව්‍යාපෘතිය මඟින් පවත්වනු

ලබන පුහුණු කාර්යයන් සඳහා විශේෂඥයන් තේරීම පමණක් වේ. තවද, රජයට අයත් ආයතනයක් වන මොරටුව විශ්ව විද්‍යාලය කොන්ත්‍රාත්තුව ප්‍රදාන කිරීම සඳහා තෝරා ගෙන ඇත්තේ ඉහත සඳහන් කමිටුවේ අනුමැතිය පදනම් කරගෙනය.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**--------------------------------**

ව්‍යාපෘතියේ කාර්යයන් අදාල ඉලක්කයට වඩා පසුගාමීව පැවතුණ නමුත් ඒ මත අය කළ යුතු ප්‍රමාද ගාස්තු අතහැර ඇත්තේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා හා කොන්ත්‍රාත්කරු අතර පවතින අන්‍යෝන්‍ය අවබෝධතාවය මතය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම්වලට අනුව ව්‍යාපෘතියේ තීරණාත්මක අවස්ථා ළඟා කරගැනීම ප්‍රමාද වීමට රේඛීය අමාත්‍යාංශය හා කොන්ත්‍රාත්කරු යන දෙදෙනාම දායක වී ඇත. එම නිසා, එක් එක් පාර්ශව වල වගකීම් එකිනෙකා අතර ඔවුන්ගේ අනන්‍යතාවන් මත මැනිය නොහැකි අතර කොන්ත්‍රාත්කරු මත දඩ පැමිණවීම ප්‍රායෝගික නොවේ.